[© ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உ.யர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

යුරෝපා ඉතිහාසය II (II කොටස)
ஐரோப்பிய வரலாறு II (பகுதி II)
History of Europe II (Part II)

25 B | **S** | **II**

යුරෝපා ඉතිහාසය - ග්‍රීක-රෝම අවධියේ සිට ක්‍රි.ව. 1989 දක්වා

උපදෙස්:

- පිළිතුරු සැපයිය යුතු **මුළු** ප්‍රශ්න සංඛ්‍යාව **හතරකි.**
- **II කොටස A, B** හා **C** ලෙස කොටස් **තුනකින්** සමන්විත වේ.
- **A කොටසේ** ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **B** හා **C කොටස්වලින්** එක් කොටසකින් අවම වශයෙන් **එක** ප්‍රශ්නයක්වත් තෝරා ගෙන **තවත්** ප්‍රශ්න **තුනකට** පිළිතුරු සපයන්න.

(**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **යුරෝපයේ දළ සිතියමක් I කොටස** සමඟ සපයා ඇත.)

A කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

(i) ඊජියන් මුහුද	(ii) ටයිබර් ගඟ	(iii) සයිප්‍රස්
(iv) කොන්ස්තන්තිනෝපලය	(v) කැස්පියන් මුහුද	(vi) ජිබ්‍රෝල්ටා සමුද්‍ර සන්ධිය
(vii) ලිස්බන්	(viii) ස්කොට්ලන්තය	(ix) සේන් ගඟ
(x) පෝලන්තය	(xi) ලෙනින්ග්‍රෑඩ්	(xii) යාල්ටා

(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01

B කොටස

2. පහත සඳහන් ක්ෂේත්‍රවල පුරාණ ග්‍රීකයන්ගේ ප්‍රධාන කාර්ය සාධනයන් සාකච්ඡා කරන්න.
   (i) කලාව සහ ගෘහනිර්මාණ ශිල්පය
   (ii) සාහිත්‍යය හා දර්ශනය (ලකු

3. "පුනරුදය යුරෝපයෙහි නූතනත්වයේ උපත සලකුණු කරයි."
   (i) "පුනරුදය" යන්නෙන් අදහස් කරන්නේ කුමක් දැ'යි නිර්වචනය කරන්න. (ලකු
   (ii) පුනරුද කලාකරුවන්ට අනුග්‍රහ දැක්වූ **ප්‍රකට පවුලක්** සහ **පාප්වරයෙක්** නම් කරන්න. (ලකු
   (iii) පුනරුද කලාකරුවන් **දෙදෙනකු** නම් කරන්න. (ලකු
   (iv) කලාව හා විද්‍යාව යන ක්ෂේත්‍රවල ඇතිවූ වර්ධනයන් ඇසුරෙන් පුනරුදය යුරෝපයෙහි නූතනත්වයේ උපත සලකුණු කරන ලද ආකාරය පරීක්ෂා කරන්න. (ලකු

4. ප්‍රංශ විප්ලවය ඇතිවීමට තුඩු දුන් දේශපාලන හා සමාජ-ආර්ථික සාධක විග්‍රහ කරන්න. (ලකු

5. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.
   (i) බටහිර රෝම අධිරාජ්‍යයට එල්ල වූ ම්ලේච්ඡ ආක්‍රමණ
   (ii) ස්පාඤ්ඤයන් නිරත වූ දේශ ගවේෂණ
   (iii) එංගලන්තයේ කැබිනට් ක්‍රමයේ වර්ධනය
   (iv) වෙස්ට්ෆේලියා සාම ගිවිසුම

(ලකුණු 08 × 2

C කොටස

6. (i) වියානා සම්මේලනයේ ප්‍රධාන අරමුණු විස්තර කරන්න. (ලකුණු 07 යි)

   (ii) වියානා සම්මේලනය විසින් ගනු ලැබූ ප්‍රධාන තීරණ විග්‍රහ කරන්න. (ලකුණු 09 යි)

7. "ප්‍රශියානු බලය ජර්මන් රාජ්‍ය පුරා ව්‍යාප්ත කිරීමෙන් ජර්මනිය නිර්මාණය කරන ලදී."

   (i) 1834 දී ප්‍රශියානු නායකත්වය යටතේ පිහිටුවන ලද තීරු බදු සංගමය නම් කරන්න. (ලකුණු 01 යි)

   (ii) ස්වකීය නායකත්වය යටතේ ජර්මනිය එක්සත් කරන ලද ප්‍රශියානු නායකයා නම් කරන්න. (ලකුණු 01 යි)

   (iii) 1815 සිට 1848 දක්වා කාලය තුළ ජර්මනිය එක්සත් කිරීමට එරෙහි ව තිබූ බාධක **දෙකක්** සැකෙවින් දක්වන්න. (ලකුණු 04 යි)

   (iv) එක්සත් ව්‍යාපාරයේ ප්‍රධාන අවස්ථා කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ජර්මනිය එක්සත් කිරීමෙහිලා ප්‍රශියාව ඉටුකළ කාර්යභාරය විචාරාත්මක ව විමසන්න. (ලකුණු 10 යි)

8. (i) "සීතල යුද්ධය" යන්නෙන් අදහස් කරන්නේ කුමක් දැ'යි නිර්වචනය කොට, එය ඇති වූ ආකාරය සැකෙවින් දක්වන්න. (ලකුණු 07 යි)

   (ii) 1962 තෙක් සීතල යුද්ධය ජාත්‍යන්තර දේශපාලනය කෙරෙහි බලපෑවේ කෙසේ දැ'යි සාකච්ඡා කරන්න. (ලකුණු 09 යි)

9. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

   (i) නැපෝලියන් බොනපාට්ගේ විදේශ ප්‍රතිපත්තිය

   (ii) බොල්ෂෙවික් විප්ලවය

   (iii) ඉතාලියේ ෆැසිස්ට්වාදය

   (iv) එක්සත් ජාතීන්ගේ සංවිධානය

(ලකුණු 08 × 2 = 16 යි)